# භාෂාව හා සංගීතය

සංස්කෘතිය විසින් මිනිසා මෙහෙයවෙන අතර මිනිසා සංස්කෘතිය නිර්මාණය කරයි. එයට ප්‍රධාන හේතුව වන්නේ ඕනෑ ම මිනිසකු (වනයේ අත්හරිනු ලැබුවකු වැන්නකු හැරෙන්නට) ඉපදෙන්නේ යම් සංස්කෘතික පරිසරයක වීම ය. එලෙස ඉපදුණු මිනිසා ක්‍රියා කරන්නේ තම සාංසාරික පුරුදු හැරුණු කොට ජෛවීය හා සංස්කෘතික හේතු අනුව වීම ය. එහෙත් ඕනෑ ම මිනිසකුට සංස්කෘතිය වෙනස් කිරමේ හැකියාව ද වෙයි. එයින් අදහස් කරන්නේ සියලු මිනිසුන් තම තමන් ගේ සංස්කෘතීන් වෙනස් කරන බව නො වෙයි. සංස්කෘතියක් සුළු වශයෙන් හෝ වෙනස් කිරමේ හැකියාව සෑම අයකුට ම තිබුණ ද, එසේ කිරමට අවස්ථාව ලැබෙන්නේ නිර්මාණශීලී කිහිප දෙනකුට පමණ ය. ඒ නිර්මාණශීලී අයට ද එවැනි අවස්ථාවක් උදාවනුයේ අදාළ සමාජයට එවැනි වෙනසක් අවශ්‍ය වූ විටක ය. ඇතැම් විට ඒ අවශ්‍යතාව අදාළ පුද්ගලයා තම කටයුත්ත ඉටු කර මිය යෑමෙන් පසුව උදාවනු ඇත. එවිට සමාජය, එනම් සමාජයේ එවකට ජීවත්වන පුද්ගලයන් යට කී තැනැත්තා ගේ අදහස් ප්‍රයෝජනයට ගනු දැකගත හැකි ය.

භාෂාව විසින් මිනිසා මෙහෙයවෙන්නේ යැ යි කියන ලැකාන්වාදීන් සිතන්නේ භාෂාව දෙවියන් ගේ නිර්මාණයක් කියා ද? භාෂාව ද නිර්මාණය කරන්නේ මිනිසුන් බව ඔවුනට අමතක වන්නේ ද? භාෂාව හා යම් සමාජයක ඇති සංගීතය අතර සම්බන්ධය අප විසින් තේරුම් ගැනෙන්නේ කෙසේ ද? භාෂාවේ කෙළවර සංගීතය වේ යැ යි රැන්ඩොල්ෆ් පඬිවරයා කියා ඇති බව අමරදේව විද්වතා කලකට පෙර නිතර පැවසුවේ ය. එහෙත් එය එසේ නො ව සංගීතයේ කෙළවර භාෂාව වන්නේ යැ යි යනුවෙන් වෙනස් කළ යුතු බව සඳහන් කෙළෙමු. අප එවැනි නිගමනයන්ට පැමිණියේ මිනිස් නිර්මාණ ගැන සැලකිලිමත් වීමෙන් ය. මිනිසුන් පළමුවෙන් නිර්මාණය කළ ශබ්ද ඉතා සරල ඒවා විය යුතු ය. සංගීතය මෙන් ම භාෂාව (කථන) ද අවසාන වශයෙන් ගත් කල ශබ්ද වෙයි. වචනයක් යනු තරමක් හෝ සංකීර්ණ ශබ්දයක් වෙයි. මූලික සංගීතයක ශබ්ද වචන තරම් සංකීර්ණ නො වෙයි. ඉතා ඈත අතීතයේ දි මිනිසුන් විසින් පළමුවෙන් නිර්මාණය කෙරෙන්නට ඇත්තේ සංගීතය මිස භාෂාව (වචන) නො වෙයි. සංගීතය යනු ද හුදු ශබ්ද මාලාවක් නො වෙයි. ශබ්ද සමූහයක් සංගීතයක් බවට පත් වන්නේ ඒ ශබ්ද රටාවකට (මුල දී තාලය, තනුව, නාද රටාව, රිද්මය ආදී වශයෙන් වෙනස්කම් තිබිණි යැ යි සිතිය හැකි නො වෙයි. ඒ සියල්ලට අපි රටාව යැ යි කියමු) එකතු වන්නේ නම් පමණකි. නැත හොත් ශබ්දවලින් ඇතිවන්නේ හුදු ශබ්දයක් නැත්නම් ඝෝෂාවක් පමණකි.

ශබ්ද සරල රටාවක ගොනු කිරම සංකීර්ණ ශබ්දයක් වූ වචනයක් නිර්මාණය කිරමට වඩා පහසු විය යුතු ය. මෙයින් අදහස් කරන්නේ සංකීර්ණ නාද රටා නිර්මාණය පහසු කටයුත්තක් ය යන්න නො වන බව පැහැදිලි විය යුතු ය. අප මෙයි දී අදහස් කරන්නේ සරල ශබ්ද රටා පමණකි. මේ රටා ඇති වූයේ කිනම් පසුබිමක ද යන්න අපට හරි හැටි කිව නොහැකි ය. සමහර විට ඒ වන විටත් ගොඩනගාගෙන තිබූ සංස්කෘතිය එහි දී වැදගත් සාධකය බවට පත්වන්නට ඇත. ඒ සමග තමන් ජීවත් වූ පරිසරයේ රිද්මය එයට බලපාන්නට ඇත. කෙසේ වෙතත් යම් ජන කොටසක් භාෂාවක් නිර්මාණය කිරමට පෙර යම් සරල සංගීතයක් ගොඩනගාගත්තාට සැකයක් නැත. එමෙන් ම ශබ්ද රටා නිර්මාණය කිරමට හැකි කටට පමණක් නො වන බව ද අප අමතක නොකළ යුතු ය. ලීයකට තවත් ලීයකින් ගැසීමෙන් හෝ වෙනත් අයුරකින් හෝ ශබ්ද රටා නිර්මාණය කිරමට හැකි ය. එහෙත් එවැනි ක්‍රමයකින් වචනයක් නිර්මාණය කළ හැකි නො වෙයි. අද ඉතා ම වර්ධනයකට ලක් වී ඇති සංගීත භාණ්ඩයකින් වුව ද කෙරෙන්නේ වචන නො වූ ශබ්ද (රටා) නිර්මාණයක කිරම ය.

මිනිසුන් කතා කරන භාෂාව හා ඒ සමාජයේ සංගීතය අතර ඇති සම්බන්ධතාව දැන ගැනීමට අපට ඉහත සඳහන් කරුණු උපයෝගී කර ගත හැකි ය. මුලින් ම යම් සංගීතයක් නිර්මාණය කළ මිනිසුන් වචන නිර්මාණය කිරමෙන් පසුව තමන්ට හුරු පුරුදු ශබ්ද රටා ආකාරයකට ඒ වචන ද හැසිරවීමට කටයුතු කරන්නට ඇත. කතා කරන භාෂාවෙහි ලතාව හා ඒ ජන සමාජයෙහි මූලික සංගීතය අතර රටාව වශයෙන් ගත් කල එවැනි සමීප සම්බන්ධයක් තිබිය යුතු ය. මේ උපකල්පනය, නැත්නම් උපන්‍යාසය (hypotheses) පරකෂාවට භාජනය කළ හැක්කකි. ඒ අරුතින් ගත් කල සංගීතය ඇත්තේ භාෂාව නවතින තැන නො ව භාෂාව ඇත්තේ මූලික සංගීතය නවතින තැන ය. භාෂාවත් සංගීතයත් යන දෙක ම නිර්මාණය වීමෙන් පසුව ඒ දෙක එකිනෙක පෝෂණය කරමින් යම් දුරකට වැඩෙන්නට ඇත. භාෂාව ආධාරයෙන් පසු කලෙක වියුක්ත සංකල්ප නිර්මාණය කිරමෙන් පසු ව යම් වියුක්ත සංගීතයකට ද මිනිසා

© Prof. Nalin De Silva

යොමුවන්නට ඇතැ යි සිතිය හැකි ය. කෙසේ වෙතත් මෙහි දී වැදගත් වන්නේ භාෂාව ද මිනිසා ගේ නිර්මාණයක් ය යන්න හා භාෂාව යනු සංස්කෘතියෙහි කොටසක් පමණක් ය යන්න ය.

බටහිරයන්ට ඇති විශාල ම ප්‍රශ්නය ඔවුන්ට චක්‍රීය ව සිතීමට නොහැකිවීම ය. භාෂාව හා සංස්කෘතිය මිනිසා ගේ නිර්මාණ වෙයි. එහෙත් ඉන් කියැවෙන්නේ භාෂාව විසින් හෝ සංස්කෘතිය විසින් හෝ මිනිසා නොමෙහෙයවෙන බව නො වෙයි. ඒක රේඛීය ව සිතන කල භාෂාව විසින් මිනිසා මෙහෙයවෙන්නේ නම් මිනිසාට භාෂාව වෙනස් කිරමට, වර්ධනය කිරමට, මෙහෙයවීමට නොහැකි ය. එහෙත් පැහැදිලිව ම භාෂාවන් වෙනස්වන බව අපි දනිමු. එසේ වෙනස් කරන්නේ ද මිනිසා ගේ මැදිහත් වීමෙන් බව ද අපි දනිමු. මිනිසා භාෂාව ඇතුළු සංස්කෘතිය නිර්මාණ කරන අතර භාෂාව ඇතුළු සංස්කෘතියෙන් ද මෙහෙයවෙයි. එහි ඇත්තේ චක්‍රීය සම්බන්ධයකි. එහෙත් භාෂාව නිර්මාණය කිරමට පෙර සංස්කෘතිය ද, එයටත් පෙර සත්ත්වයා ද විය. මෙහි මිනිසා වෙනුවට සත්ත්වයා ලෙස යෙදී ඇත්තේ ඇතැම් විට මිනිසා වානර ගෝත්‍රයෙන් පරිනාමය වී නම් මුල දී ම යම් වානර සංස්කෘතියක් මිනිසාට තිබෙන්නට හැකියාවක් වූ බැවින් ය.

සංගීතය මෙන් ම චිත්‍ර ශිල්පය ද මිනිසා භාෂාව නිර්මාණය කිරමට පෙර නිර්මාණය කර ඇති බව පැහැදිලි ය. ගුහාවක හෝ ලෙනක හෝ තමන් දුටු සතකු ගේ චිත්‍රයක් කුරුටුගෑමට ඇතැමුන් ඉහත දී ම පුරුදු වන්නට ඇත. චිත්තරූප චිත්‍රයට නැඟීමට ද මිනිසුන් කල්ගත වීමේ දී පුරුදු වන්නට ඇත. භාෂාව, එනම් වචන චිත්‍රයට නැඟීම ඉතා ම අමාරු කටයුත්තකි. වචනයක් වෙනුවට චීන ජාතිකයන් මෙන් චිත්‍රයක් ඇඳීම එක් ක්‍රමයක් වෙයි. ඒ සංයුක්ත ක්‍රමයකි. අනෙක් ක්‍රමය වනුයේ වචනයක් විශ්ලේෂණය කර එහි ඇති ශබ්ද (ස්වර හා ව්‍යඤ්ජන වශයෙන්) වෙන් කර ඒ එක් එක් ශබ්දය සඳහා චිත්‍රයක් ඇඳීම ය. මේ දෙවැනි ක්‍රමය වියුක්ත ක්‍රමයකි. එලෙස ඇඳි චිත්‍රවලට අකුරු යැ යි කියනු ලැබෙයි. වචන එලෙස අක්ෂර භාවිතයෙන් ඇඳීම හෙවත් ලිවීම පහසු කාර්යයක් නො වෙයි. එයට ද ඒ ඒ අවස්ථාවෙහි මිනිසුන් සතු ව තිබූ සංස්කෘතිය විශාල වශයෙන් බලපෑවාට සැකයක් නැත. ඒ ඒ ව්‍යඤ්ජනයට අක්ෂරයක් නිර්මාණය කර ඉන්පසු ඒ ඒ ව්‍යඤ්ජනය ස්වරයක් සමග එකතු වූ විට ලැබෙන ශබ්දය සඳහා පිළි ආශ්‍රිත පද්ධතියක් ගොඩනගා ගැනීම කළ හැක්කේ වියුක්ත චින්තනය ඇති ජනතාවකට ය. වෛදිකයන්ට පළමුව අපේ කලාපයෙහි, එනම් සාමාන්‍යයෙන් ගත් කල අද සාක් කලාපය යැ යි හැඳින්වෙන ප්‍රදේශයෙහි එවැනි අක්ෂර මාලාවක් තිබිණි නම් ඉන් කියැවෙන්නේ අපට ආර්යයන් භාරතයට පැමිණීමට පෙර වියුක්ත චින්තනයක් තිබුණු බව ය. ඒ සොයා බැලිය යුතු කරුණකි.

අකුරු, වචන, සංස්කෘතිය, භාෂාව, සංගීතය, චිත්‍ර ආදී සියල්ල මිනිසා ගේ නිර්මාන වෙයි. එහෙත් ඒ සියල්ල විසින් මිනිසා හැඩගස්වනු ලැබෙයි. ඒ හැඩගැස්වීම ඔස්සේ මිනිසා තව තවත් වචන නිර්මාණය කරයි. තව තවත් සංස්කෘතිය වර්ධනය කරයි. මෙය නොනවතින චක්‍රයකි. මිනිසා විසින් නිර්මාණය කෙර ඇත්තේ ඉහත සඳහන් දෑ පමණක් නො වේ ය යන්න මේ ලිපිවල ප්‍රධාන තේමාව වෙයි. සංගීතය හා චිත්‍ර පමණක් නො ව ගුරුත්වාකර්ෂණ ප්‍රවාදය ද මිනිසා ගේ නිර්මාණයකි. කෙටියෙන් කිව හොත් මුළු ලෝකය ම මිනිසා ගේ නිර්මාණයකි. යමකු ගේ ලෝකය යනු ඒ අයට ඒ අය ගේ සංස්කෘතිය විසින් ලබා දී ඇති ලෝකය ඒ අය විසින් ලබාගෙන ඇති ආකාරය ය. ඒ අය තම ලෝකයට වැඩිපුර යමක් එකතු කර තිබෙනවා විය හැකි ය. නැත හොත් ඉන් යමක් අඩු කර තිබෙනවා විය හැකි ය. ඒ කුමක් වුවත් ඒ ලෝකය ඒ අය ගේ ලෝකය වන අතර වෙනත් අයකු ගේ ලෝකයෙන් වෙනස් වෙයි. ඒ ඒ ලෝකය ඒ ඒ අය ගේ නිර්මාණය වෙයි. නිරක්ෂකයා ගෙන් තොර ව සංකල්පීය වශයෙන් කිසිවක් නැත යන්න මෙහි තේරුම වෙයි. මෙය නාගර්ජුනපාදයන්වහන්සේ ගේ සූත්‍රගත කිරමට බොහෝ සමීපවන නමුත් ඇතැම් ප්‍රධාන කරුණුවල දී ඉන් වෙනස් වෙයි. අපි මේ කරුණු තව දුරටත් සාකච්ඡා කරමු.

එහෙත් එයට පෙර තවත් වැදගත් කරුණක් ප්‍රකාශ කිරමට මේ සුදුසු අවස්ථාව වෙයි. සියල්ල මිනිසා ගේ (සත්ත්වයා ගේ, නිරක්ෂකයා ගේ) නිර්මාණ නම් එහි දී ප්‍රධාන වන්නේ මනස නම්, මනස ඇත්තේ කොහේ ද? බටහිර විද්‍යාඥයන් ගෙන් අති විශාල බහුතරය තවමත් කියන්නේ මනස මොළය හා සම්බන්ධ බව ය. ඉතා සරල ව කිව හොත් මනස මොළය හා බැඳී ඇති බව බටහිර විද්‍යාඥයෝ කියති. මොළය නැති ව මනසක් පැවතිය නොහැකි බව ඔවුන් ගේ මතය වෙයි. මේ බටහිර විද්‍යාවේ මතයක් පමණක් බවත් ඒ බටහිර විද්‍යාඥයන් ලෝකය දකින ආකාරය බවත් අප

© Prof. Nalin De Silva

මතක තබාගත යුතු ය. වෙනත් වචනවලින් කියන්නේ නම් බටහිර විද්‍යාඥයන් නිර්මාණය කර ඇති ලෝකයෙහි මනස ඇත්තේ මොළයෙහි ය. අවාසනාවකට මෙරට ඇතැම් බෞද්ධයෝ ද ඒ මතය අනුමත කරති.

එහෙත් මොළයක් ඇති බෞද්ධයකුට මනස ඇත්තේ මොළයෙහි ය හෝ එයට වඩා තරමක් දුර්වල ව මනස මොළය සමග බැදී ඇත හෝ යනුවෙන් කිව නොහැකි ය. මොළය ඇති බෞද්ධයන් මෙන් ම, මොළය නැති බෞද්ධයන් ද වන බැවින් ඇතැම් බෞද්ධයන් මනස ඇත්තේ මොළයෙහි ය ආදී වශයෙන් ප්‍රකාශ කරන විට අප කළබල විය යුතු නො වෙයි. එහෙත් මොළයක් නැති ඔවුනට ඔවුන් ගේ ම මතවාදය අනුව නම් මනසක් ද තිබිය නොහැකි ය. මනස ඇත්තේ යම්කිසි ආකාරයකට හෝ මොළය සමග බැදී නම් පුනබ්භවයෙහි දී හෝ පුනරුත්පත්තියෙහි දී හෝ ප්‍රශ්නවලට මුහුණ දීමට සිදු වෙයි. මෙලොව ජීවත්වන සත්ත්වයකු ගේ මනස ඇත්තේ මොළයෙහි යැ යි සිතමු. ඒ සත්ත්වයා මිය යෑමෙන් පසුව ඒ සත්ත්වයා ගේ මනස ඇත්තේ කොහේ ද? සත්ත්වයා මියගොස් ඇති බැවින් මොළය ද අකර්මණ්‍ය වී මැර ඇත. මැරුණු මොළයක මනසක් නොතිබිය හැකි බව ඉහත කී මොළය නැති බෞද්ධයන් වුව ද පිළිගන්නවා ඇතැ යි සිතමු. එහෙත් මිය ගිය සත්ත්වයා වෙනත් භවයක උපත ලබයි ඒ භවය මිනිස් හෝ වෙනත් සත්ත්ව භවයක් විය හැකි ය. ඒ භවය මිනිස් භවයක යැ යි සිතමු. ළදරු කලලයේ මොළය ඇති වන්නේ ටික කාලයක් ගතවීමෙන් පසුව ය. නැවත උත්පත්තියක් ලබන සත්ත්වයකු ඒ කලලය තම සිරුර බවට පත් කරගත්තේ එසේ මොළය ඇති වීමෙන් පසුව ද? දෙවියකු හෝ බඹකු හෝ ලෙස උත්පත්තියක් ලබන සත්ත්වයකුට මනස යනුවෙන් යමක් පවතින්නේ ද? එසේ මනසක් ඇත්නම් ඒ පවතින්නේ කා ගේ මොළයක ද?

බටහිර විද්‍යාඥයන් ගේ ඉහත සඳහන් මතයට විරුද්ධ මතයක් දැන් එහි ඉතා ඉතා ස්වල්ප දෙනකු අතරින් නිර්මාණය වෙමින් පවතියි. පසුගිය මාර්තු 25 වැනිදා නිව් සයන්ටිස්ට් සඟරාවෙහි මනස ඇත්තේ මොළය තුළ ද, පිටත ද නැත්නම් වෙනත් තැනක ද යන මාතෘකාව යටතේ පළ වී ඇති ලිපියක මේ ප්‍රශ්නය සාකච්ඡා වෙයි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva